(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 38.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 මාර්තු 11 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කුකුළු මස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළදී කුකුළු මස් අපනයනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කාල සීමාව තුළදී කුකුළු මස් ආනයනය කර තිබේද;

(v) එසේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකාවේ කුකුළු මස් කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

482/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ අරාබි විද්‍යාල ලියාපදිංචි කර නඩත්තු කරන බවත්;

(ii) මවුලවි සහතිකය ලබා දීම සඳහා එම එක් එක් අරාබි විද්‍යාල වෙන වෙනම විභාග පවත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මවුලවි සහතිකය ලබා දීම සඳහා රජය විසින් පොදු විභාගයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

486/2025

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කහපොල පිහිටා ඇති 'රෙජිඩේල් වත්ත' නමැති ඉඩම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින්නේද;

(ii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iii) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට එම ඉඩමේ සිදු කරනු ලබන කටයුතු කවරේද;

(iv) එම ඉඩම සම්බන්ධයෙන් ඉදිරි වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

509/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයට ආසන්නව හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලවේ ගඟ හරහා ලියන්ගස්තොට පාලම ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය සහ අවසන් කිරීමට නියමිතව තිබූ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාලමේ ඇස්තමේන්තුගත වටිනාකම කොපමණද;

(iv) එවකට එම පාලමේ ඉදිකිරීම් භාරව කටයුතු කරන ලද අමාත්‍යාංශය/ආයතනය කවරේද;

(v) එය ඉදිකරන ලද කාලයේදී අදාළ අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයා කවුරුන්ද;

(vi) මේ වනවිට එම පාලමේ වැඩ අවසන් කර තිබේද;

(vii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර කර තිබේ නම්, ඒ හේතුවෙන් විනාශ වී ඇති ද්‍රව්‍ය කවරේද;

(viii) ඒවායේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත — (දහඅටවැනි වෙන් කළ දිනය) — කාරක සභාව.

(මාර්තු 10 දින ප්‍රගතිය)

*2.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— මිල්කෝ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(ඇ) වගන්තිය යටතේ 2023.08.10 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මිල්කෝ (පුද්ගලික) සමාගමේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*3.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— මිල්කෝ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(ඇ) වගන්තිය යටතේ 2024.02.09 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මිල්කෝ (පුද්ගලික) සමාගමේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*4.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2020),— 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය යටතේ 2023.11.21 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*5.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා (2015, 2016, 2017, 2018, 2019 හා 2020),— 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ 2023.07.05 දින ඉදිරිපත් කරන ලද, පිළිවෙලින් 2015.12.31, 2016.12.31, 2017.12.31, 2018.12.31, 2019.12.31 හා 2020.12.31 යන දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ, 2015, 2016, 2017, 2018, 2019 හා 2020 යන වර්ෂයන්හි වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.11.15 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.05.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*6.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2021),— 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ 2023.08.23 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.11.15 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.05.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ඇල්කඩුව වැවිලි සමාගමේ වාර්ෂික වාර්තා (2012, 2013, 2014, 2015, 2016 හා 2017),— 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 වගන්තිය යටතේ 2023.11.23 දින ඉදිරිපත් කරන ලද 2012.12.31, 2013.12.31, 2014.12.31, 2015.12.31, 2016.12.31 සහ 2017.12.31 දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඇල්කඩුව වැවිලි සමාගමේ 2012, 2013, 2014, 2015, 2016 සහ 2017 වර්ෂවල වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2017),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2024.02.09 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව (2020/2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.24 දින ඉදිරිපත් කරන ලද 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2020/2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ 2024.01.23 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2021),— 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ 2024.01.23 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 33 වන වගන්තිය යටතේ 2023.09.08 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 20(2) වන වගන්තිය යටතේ 2024.03.22 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 23(4) වන වගන්තිය යටතේ 2024.03.22 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 40(1) වන වගන්තිය යටතේ 2024.02.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2022),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 40(1) වන වගන්තිය යටතේ 2024.05.07 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ගාලු උරුමය පදනමේ වාර්ෂික වාර්තාව (2021),— 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනතේ III කොටසේ 16 වන වගන්තිය යටතේ 2023.12.06 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ගාලු උරුමය පදනමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.07.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*23.

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව (2021),— 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 31 වගන්තිය යටතේ 2023.10.17 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික තරුණ සේවා සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.07.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*24.

බලශක්ති අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව (2021),— 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2023.12.13 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*25.

බලශක්ති අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව (2022),— 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2024.03.05 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*26.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නියෝගය,— 2012 අංක 12 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු 2013 අංක 12 දරන මුදල් පනතේ 12 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 නොවැම්බර් 22 දිනැති අංක 2411/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.14 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් 2013 ජූලි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, 2013 සැප්තැම්බර් 17 දිනැති අංක 1828/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹි ගිවිසුම සංශෝධනය කරමින් 2024 දෙසැම්බර් 16 දින ඇති කරගත් 2025.02.20 වැනි දින ඉදිරිපත් කරන ලද සන්ධාන පත්‍රය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 දෙසැම්බර් 22 දිනැති අංක 2415/79 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 27 දිනැති අංක 2421/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තිය යටතේ මත්පැන් සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2025 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

"විසර්ජන" පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---